**ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමණාකරන ව්‍යාපෘතිය- සංරචක 02 ( පළාත් මාර්ග වැඩිදියුණු කිරීම)- 2019**

---

ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමණාකරන ව්‍යාපෘතිය- සංරචක 02 ( පළාත් මාර්ග වැඩිදියුණු කිරීම) 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර 2017 සැප්තැම්බර් 29 දින එලඹි අංක 5788 - එල්කේ දරන ණය ගිවිසුමේ උපලේඛන 01 හි 4.2 ව්‍යාස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ සංශෝධිත මූල්‍ය ගිවිසුමට අනුව, එවකට රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වර්තමානයේ රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර සියළුම පළාත් මාර්ග අධිකාරීන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ වත්කම් කළමණාකරණ පිළිබඳ මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතාව ශක්තිමත් කිරීම හා පළාත් මාර්ග සඳහා ප්‍රවේශ හා කළමණාකරණ රාමුව වැඩිදියුණු කිරීම වේ. ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 21,875 කට සමාන එජඩො මිලියන 125 වේ. ව්‍යාපෘතියේ සංශෝධිත මූල්‍ය ගිවිසුමට අනුව සංරචක 02 හි සංශෝධිත ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 19,075 කට සමාන එජඩො මිලියන 109 වන අතර මුළු මුදලම මූල්‍යායනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සමායතනය එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 මැයි 02 දින ආරම්භ කර තිබුණු අතර 2023 මාර්තු 31 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

## 1.3 තත්ත්වාගණන කල මතය

මාගේ වාර්තාවේ 2 වගුවේ දැක්වෙන කරුණු වලින් වන බලපෑම හැර ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | මුදල රු.මිලියන | බලපෑම | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | වැඩ අත්තිකාරම් ලෙස මුළු මුදල රු.මිලියන 81.55 ක් කොන්ත්‍රාත්කරුවන් 4 දෙනෙකු වෙත ගෙවා තිබුණි.කෙසේවෙතත් වැඩ අත්තිකාරම් පිළිවෙලින් සිවිල් වැඩ සහ කෙරීගෙන යන වැඩවල අවසාන ගෙවීමක් වශයෙන් ගිණුම් ගත කර තිබුණි. | 81.55 | මූල්‍ය ප්‍රකාශන නිවැරදි නොවේ. | අනාගතයේදී මෙම ගැටලුව නිවැරදි කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණ ප්‍රමිති සමග අනුකූල විය යුතුය. |
| (ආ) | මූල්‍ය ගිණුමේ II ව්‍යවස්ථාව ප්‍රකාරව ලබා නොගත් ශේෂය මත බැදීම් ගාස්තු සහ ලබාගත් ණය ශේෂය සේවා ගාස්තු සහ පොළිය මූල්‍ය පුකාශන වලට ගෙන නොතිබුණ. | | -එම- | ගෙවීම් වාර්තා ලැබී නොතිබුණි. | සේවා ගාස්තු සහ පොළියට අදාල ගිණුම් පොත් තබා ගැනීමට පියවර ගත යුතුය. |

### 2.2 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 2018 අගෝස්තු 15 දිනැති අංක 18 /1682/805/051 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය | රේඛීය අමාත්‍යාංශයේ සිටින සුදුසු කාර්ය මණ්ඩලය අන්තර්ගහනය මගින් ව්‍යාපෘති කළමණාකරන ඒකකය සහ පළාත් මට්ටමේ ක්‍රියාත්මක කිරීමේ ඒකක ස්ථාපනය කල යුතු වේ. ව්‍යාපෘති කළමණාකරන ඒකකයට අමාත්‍යාංශයේ කිසිදු කාර්ය මණ්ඩලයක් පත්කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | මෙය ක්‍රියාත්මක කිරීමේ සාර්ථකත්වය සදහා බලපානු ලැබේ. | ව්‍යාපෘති කළමණාකරන ඒකකය සදහා අමාත්‍යාංශයේ සුදුසු කාර්ය මණ්ඩලයක් අන්තර්ගහනය කිරීම අනිවාර්ය අවශ්‍යතාවයක් නොවේ. | අමාත්‍ය මණ්ඩල තීරණය සමග අනුකූල විය යුතුය. |
| (ආ) | 2019 මාර්තු 05 දිනැති 2019/1 දරන කළමණාකරන සේවා | ව්‍යාපෘති සමාලෝචන කමිටු මාස 2කට වරක් පැවැත්විය යුතුය. | ව්‍යාපෘතියේ නියාමන කටයුතු | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘති සමාලෝචන කමිටු රැස්වීම් නිරන්තරයෙන් |

| | | | | |
|---|---|---|---|---|
| | චක්‍රලේඛය | කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුලදී රැස්වීම් වාරයක් පමණක් පවත්වා තිබුණි. | කාර්යක්ෂමව ඉටු නොවීමට ඉඩ ඇත. | පැවැත්වීමට අවශ්‍ය වේ. |
| (ඇ) | 2019 ජනවාරි 12 දිනැති 2019/01 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වර්ෂය තුළ 04 ක් පැවැත්වීම අවශ්‍ය වේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුලදී රැස්වීම් පවත්වා නොතිබුණි. | ව්‍යාපෘතියේ අදහස් දක්වා නියාමන නොමැත. කටයුතු කාර්යක්ෂමව සිදු නොවීමට ඉඩ ඇත. | විගණන හා කළමනාකරණ රැස්වීම් නිරන්තරයෙන් පැවැත්වීම අවශ්‍ය වේ. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| විගණන ගැටළුව | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ප්‍රතිසංවිධාන පත්‍රයට අනුව සමාලෝචිත වර්ෂය තුලදී කොන්ත්‍රාත් පැකේජ 18ක් යටතේ රු.මිලියන 7,692.30 ක ඇස්තමේන්තුගත පිරිවැයකට පළාත් මාර්ග 67ක කිලෝමීටර් 302 ක් පුනරුත්තාපන හා නඩත්තු කිරිම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත් කොන්ත්‍රාත් පැකේජ 8ක් පමණක් ප්‍රදානය කර තිබුණු අතර ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් පැකේජවල කිසිදු භෞතික ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි. | (අ) ව්‍යාපෘතිය අවසන් කිරීමේ ප්‍රමාදයන් සිදුවේ.<br><br>(ආ) පිරිවැය ඇස්තමේන්තු ඉක්මවා යාම.<br><br>(ඇ) අපේක්ෂිත පාර්ශවයන් වෙත බලාපොරොත්තු වන ප්‍රතිලාභ නොලැබේ. | අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් මිළ විචල්‍යතාවන් සමාලෝචනය කිරීම සඳහා කාලය ගතවී ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |

**3.2 පද්ධති හා පාලනයන්**

| | විගණන ගැටළුව | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට 2019 වර්ෂය සඳහා වාර්ෂික අයවැය සහ වැඩ සැලැස්ම සම්පූර්ණ කර නොතිබුණි. | ව්‍යාපෘතියේ ප්‍රගතිය කාලීනව ඇගයීමට නොහැකි අතර අවධනය අඩුවේ | වැඩ සැලැස්ම සහ අයවැය සමාලෝචිත කමිටුව වෙත ඉදිරිපත් කර තිබුණි. | අයවැය සහ ක්‍රියාකාරි සැලැස්ම පිළියල කර සමාලෝචිත කමිටුවේ අනුමැතිය ලබාගැනීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘති කළමණාකරණ ඒකකය සඳහා මුල්‍ය කළමණාකරු සහ ගණකාධිකාරිවරු 09 දෙනකු පත්කර තිබුණද ව්‍යාපෘතියේ මුල්‍ය කළමණාකරණ පද්ධතිය හඳුන්වාදී නොතිබුණු බව නිරීක්ෂණය විය. | දුර්වල මූල්‍ය කළමණාකරනයක් වේ. | Quick Book යන මෘදුකාංගය මිලදී ගැනීමට ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී. | මූලය ගිවිසුම අනුව මූල්‍ය කළමණාකරන පද්ධතිය හදුන්වා දීමට පියවර ගත යුතුය. |
| (ඇ) | මේ දක්වා ව්‍යාපෘති මෙහෙයුම් අත්පොත සකස් කර නොතිබුණි. | ව්‍යාපෘතිය සංවිධානාත්මක, පරිපාලන,නියාමනය සහ ඇගයුම් ක්‍රියාවලිය යන ක්ෂේත්‍රවල මාර්ගෝපදේශ යොදා ගැනීමකින් තොරව ක්‍රියාත්මක වෙමින් පවතී. තවද, මූල්‍ය කළමණාකරන පද්ධතිය සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ස්ථාපනය කල යුතුව පවතී. | ජාතික සමාලෝචන කමිටුවේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටී. | මූල්‍ය ගිවිසුමට අනුව ව්‍යාපෘති මෙහෙයුම් අත්පොත පිළියෙල කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කල යුතුය. |